# PRIME ENTRY BOOKS

# (Part-II)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# මුදල් ලැබීම් ජර්නලය

ව්‍යාපාරයකට මුදල් හා චෙක්පත් ලැබීම්, මුල්වරට සටහන් කරන මූලික සටහන් පොත, මුදල් ලැබීම් ජර්නලය වේ.

මුදල් හා චෙක්පත් ලැබීමට අදාළ මූලාශ්‍ර ලේඛනය **ලදුපත** වේ.

# මුදල් ගෙවීම් ජර්නලය

ව්‍යාපාරයක් මුදල් හා චෙක්පත් මගින් සිදු කරන ගෙවීම්, මුල්වරට සටහන් කරන මූලික සටහන් පොත, මුදල් ගෙවීම් ජර්නලය වේ.

මුදල් හා චෙක්පත් මගින් සිදු කරන ගෙවීම්වලට අදාළ මූලාශ්‍ර ලේඛනය **ගෙවීම් වවුචරය** වේ.

- ව්‍යාපාරයක මුදල් ගනුදෙනු, අදාළ මූලාශ්‍ර ලේඛන උපයෝගී කර ගෙන ලැබීම් හා ගෙවීම් ජර්නල්වල වාර්තා කිරීමෙන් පසුව, ද්විත්ව සටන් මූලධර්මවලට අනුව පොදු ලෙජරයට පිටපත් කළ යුතු ය.

ClassWork.LK

# මුදල් ලැබීම් ජර්නලයේ තීරුවල එකතුව පොදු ලෙජරයට පිටපත් කළ යුතු ආකාරය

| දුන් වට්ටම් තීරුවේ එකතුව | දුන් වට්ටම ගිණුම හර | ණයගැති පාලන ගිණුම - බැර |
|---|---|---|
| එක් එක් තීරුවේ එකතුව /<br>වට්නාකම් තීරුවේ එකතුව<br>අත්පිට විකුණුම් තිරුවේ එකතුව<br>ණයගැති ලැබීම් තීරුවේ එකතුව<br>ආදායම් තීරුවේ එකතුව<br>වෙනත් ලැබීම් තීරුවේ එකතුව | මුදල් ගිණුම හර | විකුණුම් ගිණුම - බැර<br>ණයගැති පාලන ගිණුම - බැර<br>එක් එක් අදාළ ආදායම් ගිණුම් වෙන් වෙන් ව - බැර<br>එක් එක් අදාළ ලැබීම් ගිණුම් වෙන් වෙන් ව - බැර |

# මුදල් ගෙවීම් ජර්නලයේ තීරුවල එකතුව පොදු ලෙජරයට පිටපත් කළ යුතු ආකාරය

| ලද වට්ටම් තීරුවේ එකතුව | ණයහිමි පාලන ගිණුම හර | ලද වට්ටම් ගිණුම - බැර |
|---|---|---|
| අත්පිට ගැනුම් තිරුවේ එකතුව<br>ණයහිමි ගෙවීම් තීරුවේ එකතුව<br>වියදම් තීරුවේ එකතුව<br>වෙනත් ගෙවීම් තීරුවේ එකතුව<br>වට්නාකම් තීරුවේ එකතුව | ගැනුම් ගිණුම හර<br>ණයහිමි පාලන ගිණුම හර<br>අදාළ එක් එක් වියදම් ගිණුම්වලට වෙන් වෙන් ව හර<br>අදාළ එක් එක් ගිණුම්වලට වෙන් වෙන් ව හර | මුදල් ගිණුම - බැර |

ClassWork.LK

# වට්ටම්

- ණය ගනුදෙනු පියවීමේ දී වට්ටම් බිහි වේ.

## දුන් වට්ටම්

ණයගැතියන් ගිවිසගත් කාලය තුළ මුදල් පියවීමේ දී ලැබිය යුතු ණය මුදලින් කරන අඩු කිරීම් දුන් වට්ටමයි. එය වියදමකි.

## ලද වට්ටම්

ණයහිමියන්ට ගිවිසගත් කාලය තුළ මුදල් පියවීමේ දී ගෙවිය යුතු ණය මුදලින් කෙරෙන අඩු කිරීම් ලද වට්ටමයි. එය ව්‍යාපාරයට අදායමකි.

ClassWork.LK

# මුදල් ලැබීම්, මුදල් ලැබීම් ජර්නලයේ සටහන් කිරීම නිදසුනක් ඇසුරෙන්

අමල්ගේ ව්‍යාපාරයේ 2017 අප්‍රේල් මාසයේ සිදු වූ මුදල් ලැබීම් හා සම්බන්ධ ගනුදෙනු

| | | | (රු.) |
|---|---|---|---|
| 2017. 04. 05 | අත්පිට විකුණුම් | (ල. අ. 01) | 60 000 |
| 2017. 04. 10 | ලද ගොඩනැගිලි කුලී | (ල. අ. 02) | 5 000 |
| 2017. 04. 15 | බැංකු ණය ලැබීම් | (ල. අ. 03) | 100,000 |
| 2017. 04. 18 | ණයගැති අමල්ගෙන ලැබුණා | (ල. අ. 04) | 9 000 |
| | අමල්ට දුන් වට්ටම | | 500 |
| 2017. 04. 20 | අත්පිට විකුණුම් | (ල. අ. 05) | 50 000 |
| 2017. 04. 22 | (ණයගැති) තිලක්ගෙන් ලැබුණා | (ල. අ. 06) | 48 000 |
| | දුන් වට්ටම් | | 2 000 |
| 2017. 04. 25 | කොමිස් ලැබුණා | (ල. අ. 07) | 1000 |
| 2017. 04. 28 | අතිරේක ප්‍රාග්ධනය යෙදීම | (ල. අ. 08) | 20 000 |

## ලැබීම් ජර්නලය / මුදල් ලැබීම් ජර්නලය

| දිනය | ලදුපත් අංකය | විස්තරය | දුන් වට්ටම් (රු.) | වටිනාකම (රු.) | විශ්ලේෂණය (රු.) | | | | ලෙ. පිටුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අත්පිට විකුණුම් | ණයගැති | ආදායම් | වෙනත් ලැබීම් | |
| 4/5 | 01 | විකුණුම් | | 60 000 | 60 000 | | | | |
| 4/10 | 02 | ගොඩනැගිලි කුලී | | 5 000 | | | 5 000 | | |
| 4/15 | 03 | බැංකු ණය | | 100 000 | | | | 100 000 | |
| 4/18 | 04 | අමල් | 500 | 9 000 | | 9 000 | | | |
| 4/20 | 05 | විකුණුම් | | 50 000 | 50 000 | | | | |
| 4/22 | 06 | තිලක් | 2 000 | 48 000 | | 48 000 | | | |
| 4/25 | 07 | ලද කොමිස් | | 1 000 | | | 1 000 | | |
| 4/28 | 08 | ප්‍රාග්ධනය | | 20 000 | | | | 20 000 | |
| | | | 2 500 | 293 000 | 110 000 | 57 000 | 6 000 | 120 000 | |

ClassWork.LK

# මුදල් ගෙවීම්, මුදල් ගෙවීම් ජර්නලයේ සටහන් කිරීම නිදසුනක් ඇසුරෙන්

| | | | |
|---|---|---|---|
| 2017. 04. 06 | මාසික විදුලි බිල ගෙවීම් | (ව.අ. 01) | 6 000 |
| 2017. 04. 08 | ණයහිමි - මාලින්දට ගෙවීම | (ව.අ. 02) | 12 000 |
| | ලද මුදල් වට්ටම් | | 1 000 |
| 2017. 04. 10 | අත්පිට ගැනුම් | (ව.අ. 03) | 18 000 |
| 2017. 04. 12 | මාසික රක්ෂණ ගාස්තු | (ව.අ. 04) | 12 000 |
| 2017. 04. 14 | ණයහිමි - සාගරට ගෙවීම් | (ව.අ. 05) | 16 000 |
| | ලද මුදල් වට්ටම් | | 1 000 |
| 2017. 04. 16 | කාර්යාල ලී බඩු ගැනීමට | (ව.අ. 06) | 50 000 |
| 2017. 04. 18 | වැටුප් හා වේතන ගෙවීම | (ව.අ. 07) | 30 000 |
| 2017. 04. 20 | බැංකු ණය වාරිකය ගෙවීම | (ව.අ. 08) | 12 000 |
| 2017. 04. 22 | අත්පිට ගැණුම් | (ව.අ. 09) | 22 000 |
| 2017. 04. 26 | මුදල් ගැනිලි | (ව.අ. 10) | 5 000 |

## මුදල් ගෙවීම් ජර්නලය

| දිනය | ලදුපත් අංකය | විස්තරය | ලද වට්ටම් (රු.) | වටිනාකම (රු.) | විශ්ලේෂණය (රු.) | | | | ලෙ. පිටුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අත්පිට ගැනුම් | ණයහිමි ගෙවීම් | වියදම් | වෙනත් ගෙවීම් | |
| 4/6 | 1 | විදුලිය | - | 6 000 | - | - | 6 000 | - | |
| 4/8 | 2 | මිලින්ද | 1 000 | 12 000 | - | 12 000 | - | - | |
| 4/10 | 3 | ගැනුම් | - | 18 000 | 18 000 | - | - | - | |
| 4/12 | 4 | රක්ෂණ ගාස්තු | - | 12 000 | - | - | 12 000 | - | |
| 4/14 | 5 | සාගර | 1 000 | 16 000 | - | 16 000 | | - | |
| 4/16 | 6 | කාර්යාල ලී බඩු | - | 50 000 | – | - | | 50 000 | |
| 4/18 | 7 | වැටුප් හා වේතන | - | 30 000 | - | - | 30 000 | - | |
| 4/20 | 8 | බැංකු ණය | - | 12 000 | - | - | - | 12 000 | |
| 4/22 | 9 | ගැනුම් | - | 22 000 | 22 000 | - | - | - | |
| 4.26 | 10 | ගැනිලි | - | 5 000 | - | - | - | 5 000 | |
| | | | 2 000 | 183 000 | 40 000 | 28 000 | 48 000 | 67 000 | |

ClassWork.LK

ඉහත අමල්ගේ ව්‍යාපාරයේ 2017.04.01 දිනට මුදල් ශේෂය රු.25 000 ක් ලෙස සලකා මුදල් ලැබීම් ජර්නලයේ හා මුදල් ගෙවීම් ජර්නලයේ ගනුදෙනු පොදු ලෙජරයට පිටපත් කිරීම පහත දැක්වේ.

## මුදල් ගිණුම / මුදල් පාලන ගිණුම

| | | රු. | | | රු. |
|---|---|---|---|---|---|
| 4/1 | ඉ/ගෙ/ශේෂය | 25 000 | | ගැනුම් ගිණුම | 40 000 |
| | විකුණුම් ගිණුම | 110 000 | | ණයහිමි පාලන ගිණුම | 28 000 |
| | ණයගැති පාලන ගිණුම | 57 000 | | වියදම් ගිණුම් | 48 000 |
| | ආදායම් ගිණුම් | 6 000 | | වෙනත් ගෙවීම් ගිණුම් | 67 000 |
| | වෙනත් ලැබීම් ගිණුම් | 120 000 | 4/30 | ශේෂය ප/ගෙ | 135 000 |
| | | 318 000 | | | 318 000 |
| 5/1 | ඉ/ගෙ/ශේෂය | 135 000 | | | |

### බැංකු ණය ගිණුම

| | | රු. | | | රු. |
|---|---|---|---|---|---|
| 4/20 | මුදල් ගිණුම | 12 000 | 4/15 | මුදල් ගිණුම | 100 000 |

### ප්‍රාග්ධන ගිණුම

| | | රු. | | | රු. |
|---|---|---|---|---|---|
| | | | 4/1 | ශේෂය ඉ/ගෙ | ×× ×× |
| | | | 4/28 | මුදල් ගිණුම | 20 000 |

### දුන් වට්ටම් ගිණුම

| | | රු. | | | රු. |
|---|---|---|---|---|---|
| 4/30 | ණයගැති පාලන ගිණුම | 2 500 | | | |

ClassWork.LK

### ලද වට්ටම් ගිණුම

| | රු. | | රු. |
|---|---|---|---|
| | | 4/30 ණයහිමි පාලන ගිණුම | 2 000 |

### ණයගැති පාලන ගිණුම

| | රු. | | රු. |
|---|---|---|---|
| | | 4.30 මුදල් ගිණුම | 57 000 |
| | | දුන් වට්ටම් ගිණුම | 2 500 |

### ණයහිමි පාලන ගිණුම

| | රු. | | රු. |
|---|---|---|---|
| 4.30 මුදල් ගිණුම | 28 000 | | |
| ලද වට්ටම් ගිණුම | 2 000 | | |

### ලද ගොඩනැගිලි කුළී ගිණුම

| | රු. | | රු. |
|---|---|---|---|
| | | 4.10 මුදල් ගිණුම | 5 000 |

### ලද කොමිස් ගිණුම

| | රු. | | රු. |
|---|---|---|---|
| | | 4.25 මුදල් ගිණුම | 1 000 |

ClassWork.LK

ගැණුම් ගිණුම

| | | රු. | | රු. |
|---|---|---|---|---|
| 4/30 | මුදල් ගිණුම | 40 000 | | |

විදුලිය වියදම් ගිණුම

| | | රු. | | රු. |
|---|---|---|---|---|
| 4/06 | මුදල් ගිණුම | 6 000 | | |

රක්ෂණ ගාස්තු ගිණුම

| | | රු. | | රු. |
|---|---|---|---|---|
| 4/12 | මුදල් ගිණුම | 12 000 | | |

කාර්යාල ලී බඩු ගිණුම

| | | රු. | | රු. |
|---|---|---|---|---|
| 4/16 | මුදල් ගිණුම | 50 000 | | |

ගැනිලි ගිණුම

| | | රු. | | රු. |
|---|---|---|---|---|
| 4/26 | මුදල් ගිණුම | 5 000 | | |

වැටුප් හා වේතන ගිණුම

| | | රු. | | රු. |
|---|---|---|---|---|
| 4/18 | මුදල් ගිණුම | 3 0 000 | | |

ClassWork.LK

# චෙක්පත් මගින් ගනුදෙනු සිදු කිරීම

බොහෝ ව්‍යාපාර මුදලින් පමණක් නොව චෙක්පත් මගින් ද ගනුදෙනු සිදු කරයි.

චෙක්පත් මගින් ගනුදෙනු කරන ව්‍යාපාරවලට ගනුදෙනු තුළින් ලැබෙන මුදල් හා චෙක්පත් ඍජුව ම බැංකුගත කරන අතර, ඒවා මුදල් ලැබීම් ජර්නලයේ වාර්තා කරයි.

චෙක්පත් මගින් කරන ගෙවීම් මුදල් ගෙවීම් ජර්නලයේ වාර්තා කරයි.

එවැනි ව්‍යාපාරයක මුදලින් සිදු කෙරෙන්නේ සුළු මුදල් ගෙවීම් පමණි. එම ගෙවීම් සුළු මුදල් ගෙවීම් ජර්නලයේ සටහන් කරයි.

සාමාන්‍යයෙන් ව්‍යාපාරයට ලැබෙන මුදල් සියල්ල ම එදිනම බැංකුවේ තැන්පත් කරයි.

ClassWork.LK

**නිදසුන :**

2017. 04. 01 තිළිණ රු. 800 000 ක් ව්‍යාපාරය නමින් බැංකු ගිණුමක තැන්පත් කර වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. පහත දැක්වෙන්නේ අප්‍රේල් මාසය තුළ සිදු වූ ගනුදෙනු වේ.

| ගනුදෙනු සිදු වූ දිනය | විස්තරය | චෙක් අංකය | වටිනාකම (රු.) |
|---|---|---|---|
| 2017. 04. 01 | අත්පිට ගැනුම් (ව. අ. 1) | 800400 | 120 000 |
| 2017. 04. 02 | ලී බඩු උපකරණ මිලට ගත්තා (ව. අ. 2) | 800401 | 80 000 |
| 2017. 04. 02 | අත්පිට විකුණුම් (ල. අ. 2) | 712520 | 200 000 |
| 2017. 04. 03 | අතුලගෙන් ණයට ගැනුම් | - | 100 000 |
| 2017. 04. 04 | වෙනුරට ණයට විකුණුම් | - | 150 000 |
| 2017. 04. 05 | සුළු මුදල් භාරකරුට ගෙවීම් (ව. අ. 3) | 800402 | 10 000 |
| 2017. 04. 06 | ගෙනඒමේ කුලී ගෙව්වා (ව. අ. 4) | 800403 | 5 000 |
| 2017. 04. 07 | තුෂාන්ගෙන් ණයට ගැනුම් | - | 80 000 |
| 2017. 04. 08 | චතුරට ණයට විකුණුම් | - | 90 000 |
| 2017. 04. 08 | මහජන බැංකුවෙන් ලබා ගත් ණය මුදල (ල. අ. 3) | - | 300 000 |
| 2017. 04. 09 | අතුලට ගෙව්වා. ලද වට්ටම් රු. 5 000 (ව. අ. 5) | 800404 | 95 000 |
| 2017. 04. 10 | වෙනුරගෙන් 10% ක වට්ටමකට යටත්ව මුදල් ලැබුණා. (ල. අ. 4) | 620703 | 135 000 |
| 2017. 04. 12 | අත්පිට විකුණුම් (ල. අ. 5) | මුදල් | 250 000 |
| 2017. 04. 14 | ගොඩනැගිලි කුලී ගෙවීම (ව. අ. 6) | 800405 | 20 000 |
| 2017. 04. 15 | අත්පිට ගැනුම් (ව. අ. 7) | 800406 | 110 000 |
| 2017. 04. 18 | තුෂාන්ට ගෙව්වා (ව. අ. 8) අඩු කළ වට්ටම් 10% | 800407 | 72 000 |
| 2017. 04. 22 | චතුරගෙන් ලැබීම් (ල. අ. 6) දුන් වට්ටම් 10% | මුදල් | 81 000 |
| 2017. 04. 25 | සේවක වේතන ගෙව්වා (ව. අ. 9) | 800408 | 10 000 |
| 2017. 04. 26 | තිළිනගේ ගැනිලි (ව. අ. 10) | 800409 | 10 000 |
| 2017. 04. 28 | ලද කොමිස් (ල. අ. 7) | මුදල් | 8 000 |

තිළිණගේ ව්‍යාපාරයේ ගනුදෙනු ලැබීම් ජර්නලයක හා ගෙවීම් ජර්නලයක සටහන් කර, ඒවායේ ඇතුළත් තොරතුරු පොදු ලෙජරයට පිටපත් කරන්න.

ClassWork.LK

## ලැබීම් ජර්නලය / මුදල් ලැබීම් ජර්නලය

| දිනය | ලදුපත් අංකය | විස්තරය | චෙක්පත් අංකය | දුන් වට්ටම් | විශ්ලේෂණය (රු.) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | වටිනාකම (රු.) | අත්පිට විකුණුම් | ණයගැති ලැබීම් | ආදායම් | වෙනත් ලැබීම් |
| 17/4/1 | 1 | ප්‍රාග්ධනය | - | - | 800 000 | - | - | - | 800 000 |
| 17/4/2 | 2 | විකුණුම් | 712 520 | - | 200 000 | 200 000 | - | - | - |
| 17/4/8 | 3 | බැංකු ණය | - | - | 300 000 | - | - | - | 300 000 |
| 17/4/10 | 4 | චෙනුර | 620 703 | 15 000 | 135 000 | - | 135 000 | - | - |
| 17/4/12 | 5 | විකුණුම් | - | - | 250 000 | 250 000 | - | - | - |
| 17/4/22 | 6 | චතුර | - | 9 000 | 81 000 | - | 81 000 | - | - |
| 17/4/28 | 7 | ලද කොමිස් | - | - | 8 000 | - | - | 8 000 | - |
| | | | - | 24 000 | 1 774 000 | 450 000 | 216 000 | 8 000 | 1 100 000 |

## ගෙවීම් ජර්නලය / මුදල් ගෙවීම් ජර්නලය

| දිනය | වවුචර් අංක | විස්තරය | චෙක්පත් අංකය | ලද වට්ටම් | විශ්ලේෂණය (රු.) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | වටිනාකම (රු.) | අත්පිට ගැනුම් | ණයහිමි ගෙවීම් | වියදම් | වෙනත් ගෙවීම් |
| 17/4/1 | 1 | ගැනුම් | 800400 | - | 120 000 | 120 000 | - | - | - |
| 17/4/2 | 2 | ලී බඩු | 800401 | - | 80 000 | - | - | - | 80 000 |
| 17/4/5 | 3 | සුලු මුදල් | 800402 | - | 10 000 | - | - | - | 10 000 |
| 17/4/6 | 4 | ගෙනප්මේ කුලී | 800403 | - | 5 000 | - | - | 5 000 | - |
| 17/4/9 | 5 | අතුල | 800404 | 5 000 | 95 000 | - | 95 000 | - | - |
| 17/4/14 | 6 | ගොඩනැගිලි කුලී | 800405 | - | 20 000 | - | - | 20 000 | - |
| 17/4/15 | 7 | ගැනුම් | 800406 | - | 110 000 | 110 000 | - | - | - |
| 17/4/18 | 8 | කුෂාන් | 800407 | 8 000 | 72 000 | - | 72 000 | - | - |
| 17/4/25 | 9 | සේවක වේතන | 800408 | - | 10 000 | - | - | 10 000 | - |
| 17/4/26 | 10 | ගැනිලි | 800409 | | 10 000 | - | | - | 10 000 |
| | | | | 13 000 | 532 000 | 230 000 | 167 000 | 35 000 | 100 000 |

ClassWork.LK

## පොදු ලෙජරයේ ගිණුම්

**දුන් වට්ටම් ගිණුම** රු.

| | |
|---|---|
| 4/30 ණයගැති 24 000<br>පාලන ගිණුම | |

**ප්‍රාග්ධන ගිණුම** රු

| | |
|---|---|
| | 4/01 මුදල් 800 000<br>ගිණුම |

**ලද වට්ටම් ගිණුම** රු

| | |
|---|---|
| | 4/30 ණයහිමි පාලන ගිණුම 13 000 |

**විකුණුම් ගිණුම** රු

| | |
|---|---|
| | 4/30 මුදල් ගිණුම 450 000 |

**සුළු මුදල් ගිණුම** රු

| | |
|---|---|
| 4/05 මුදල් ගිණුම 10 000 | |

**බැංකු ණය ගිණුම** රු

| | |
|---|---|
| | 4/08 මුදල් ගිණුම 300 000 |

**ලද කොමිස් ගිණුම** රු

| | |
|---|---|
| | 4/28 මුදල් ගිණුම 8 000 |

**ණයහිමි පාලන ගිණුම** රු

| | |
|---|---|
| 4/30 ලද වට්ටම් 13 000 | |
| 4/30 මුදල් ගිණුම 167 000 | |

**ලී බඩු ගිණුම** රු

| | |
|---|---|
| 4/02 මුදල් ගිණුම 80 000 | |

**ණයගැති පාලන ගිණුම** රු

| | |
|---|---|
| | දුන් වට්ටම් ගිණුම 24 000 |
| | මුදල් ගිණුම 216 000 |

**ගැනුම් ගිණුම** රු

| | |
|---|---|
| 4/30 මුදල් ගිණුම 230 000 | |

**ගෙන ඒමේ කුලී** රු

| | |
|---|---|
| 4/04 මුදල් ගිණුම 5 000 | |

**සේවක වේතන ගිණුම** රු

| | |
|---|---|
| 4/25 මුදල් ගිණුම 10 000 | |

ClassWork.LK

| ගොඩනැගිලි කුලී ගිණුම | රු | | ගැනිලි ගිණුම | රු |
|---|---|---|---|---|
| 4/14 | | | 4/26 | |
| මුදල් ගිණුම 20 000 | | | මුදල් ගිණුම 10 000 | |

මුදල් ගිණුම / මුදල් පාලන ගිණුම

| රු | | රු | |
|---|---|---|---|
| විකුණුම් ගිණුම | 450 000 | ගැනුම් | 230 000 |
| ණයගැති පාලන ගිණුම | 216 000 | ණයහිමි පාලන ගිණුම | 167 000 |
| ආදායම් ගිණුම් | 8 000 | වියදම් ගිණුම් | 35 000 |
| වෙනත් ලැබීම් ගිණුම් | 1 100 000 | වෙනත් ගෙවීම් ගිණුම් | 1 00 000 |
| | | 4/30 ශේ/ප/ගෙ | 1 242 000 |
| | 1 774 000 | | 1774 000 |
| 5/1 ශේ/ඉ/ගෙ | 1 242 000 | | |

ClassWork.LK

## අභ්‍යාස

මලිදුගේ ව්‍යාපාරය බැංකු ගිණුමක් මගින් සියළු මුදල් ගනුදෙනු සිදු කරයි. 2017. 04. 01 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 1 200 000 කි. 2017 අප්‍රේල් මාසයේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

| ගනුදෙනු සිදු වූ දිනය | මූලාශ්‍ර ලේඛන අංකය | විස්තරය | චෙක් අංකය | වටිනාකම (රු.000) |
|---|---|---|---|---|
| 2017. 04. 01 | ල. අ. 01 | අත්පිට විකුණුම් අත්පිට | 135 401 | 4 000 |
| 2017. 04. 02 | ව. අ. 01 | ගැනුම් සුදේශ්ගෙන් | 350 150 | 2 000 |
| 2017. 04. 03 | ල. අ. 02 | ලැබුණා සුජානිට ගෙව්වා | මුදල් | 1 500 |
| 2017. 04. 04 | ව. අ. 02 | විදුලි බිල ගෙව්වා | 350 151 | 1 400 |
| 2017. 04. 05 | ව. අ. 03 | ගෙවල් කුලී ආදායම | 350 152 | 300 |
| 2017. 04. 06 | ල. අ. 03 | නාමල්ගෙන් 10%ක වට්ටමකට යටත්ව ලැබුණා | මුදල් | 400 |
| 2017. 04. 08 | ල. අ. 04 | සුධාරකට 10%ක වට්ටමකට යටත්ව ගෙව්වා | 125 214 | 360 |
| 2017. 04. 10 | ව. අ. 04 | සේවක වේතන ගෙව්වා | 350 153 | 180 |
| 2017. 04. 12 | ව. අ. 05 | මෝටර් රථයක් ගත්තා | 350 154 | 120 |
| 2017. 04. 14 | ව. අ. 06 | බැංකු ණයක් ගත්තා | 350 155 | 2 500 |
| 2017. 04. 15 | ල. අ. 05 | නාමල්ගෙන් ලැබී තැන්පත් කර ඇති චෙක්පත අගරු වී | මුදල් | 3 000 |
| 2017. 04. 18 | අගරු නි. | ඇති බව බැංකුව දැනුම් දුන්නා. | 125 214 | 360 |
| 2017. 04. 20 | ල. අ. 06 | අත්පිට විකුණුම් | මුදල් | 4 400 |
| 2017. 04. 22 | ව. අ. 07 | පසිඳුට ගෙව්වා. ලද වට්ටම 10% කි. | 350 156 | 450 |
| 2017. 04. 24 | අගරු නි. | විදුලිය බිල සඳහා ගෙවූ චෙක්පත ලිවීමේ දෝෂයක් නිසා ආපසු ලැබුණා. | 350 152 | 300 |
| 2017. 04. 26 | ව. අ. 08 | මලිදුගේ ගැනිලි අත්පිට | 350 157 | 100 |
| 2017. 04. 28 | ව. අ. 09 | ගැණුම් හසිතගෙන් | 350 158 | 1 300 |
| 2017. 04. 29 | ල. අ. 07 | ලැබුණා | 138 146 | 350 |
| 2017. 04. 30 | ව. අ. 10 | විදුලිය වියදම් | 350 159 | 300 |

ClassWork.LK

1) ඉහත තොරතුරු ඇසුරින් 2017 අප්‍රියෙල් මාසය සඳහා මලිඳුගේ ව්‍යාපාරයේ ලැබීම් ජර්නලය හා ගෙවීම් ජර්නලය පිළියෙල කරන්න.

2) මුදල් ලැබීම් ජර්නලයේ හා මුදල් ගෙවීම් ජර්නලයේ තොරතුරු උපයෝගී කර ගෙන මුදල් ගිණුම පිළියෙල කරන්න.

ClassWork.LK

# ණයගැතියකුගෙන් ලැබුණු චෙක්පතක් අගරු වීම

ණයගැතියකුගෙන් ලැබුණු චෙක්පතක් බැංකුවේ තැන්පත් කිරීමෙන් පසුව අගරු වුවහොත් එම අගරු වීම පොදු ජර්නලය තුළ වාර්තා කළ යුතුයි.

එහි දී ණයගැතියකුට වට්ටමක් පිරිනමා ඇත්නම් සාමාන්‍යයෙන් එම වට්ටම අහිමි කෙරේ.

ඒ අනුව පහත සටහන පොදු ජර්නලය තුළ තැබිය යුතුය.

| | | | | |
|---|---|---|---|---|
| ණයගැති පාලන ගිණුම | හර | ××× | | |
| දුන් වට්ටම් ගිණුම | | | බැර | × |
| මුදල් ගිණුම | | | බැර | ×× |
| (චෙක්පත අගරු වීම හා දුන් වට්ටම අහිමි කිරීම) | | | | |

ClassWork.LK

# ණයහිමියකුට නිකුත් කළ චෙක්පතක් අගරු වීම

ණයහිමියකුට නිකුත් කළ චෙක්පතක් පසුව අගරු වුවහොත් එම අගරු වීම පොදු ජර්නලයේ වාර්තා කළ යුතු ය.

එහි දී ණයහිමියාගෙන් වට්ටම් ලැබී තිබුනේ නම් සාමාන්‍යයෙන් එම වට්ටම ද අහිමි වේ.

ඒ අනුව පහත සටහන පොදු ජර්නලය තුළ තැබිය යුතුය.

| | | | | |
|---|---|---|---|---|
| මුදල් ගිණුම | හර | ×× | | |
| ලද වට්ටම් ගිණුම | හර | ×× | | |
| ණයහිමි පාලන ගිණුම | | | බැර | ×× |
| (චෙක්පත අගරු වීම හා ලද වට්ටම අහිමි කිරීම) | | | | |

ClassWork.LK

# වියදමක් සඳහා ව්‍යාපාරය ගෙවූ චෙක්පතක් අගරු වුවහොත් එම සටහන පොදු ජර්නලය තුළ සටහන් තබන ආකාරය

| | | | |
|---|---|---|---|
| මුදල් ගිණුම | හර | ××× | |
| උපචිත වියදම් ගිණුම / වියදම් ගිණුම | බැර | | ××× |
| (වියදම් සඳහා වූ චෙක්පත් අගරු වීම) | | | |

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura